# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2022 අප්‍රේල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල් අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2022 අප්‍රේල් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 33.8%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2022 මාර්තු මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 21.5%ක් ලෙස වාර්තා විය. 2022 අප්‍රේල් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 21.1%ක හා ආහාර නොවන කාණ්ඩයේ 12.7%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2021 අප්‍රේල් මාසයේ 5.5%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 4.3%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.2%ක් විය. 2021 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2022 අප්‍රේල් මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. ඒ අනුව, ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2022 මාර්තු මාසයේදී 29.5% සිට 2022 අප්‍රේල් මාසයේදී 45.1% දක්වා වැඩි වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2022 මාර්තු මාසයේදී 14.5% සිට 2022 අප්‍රේල් මාසයේදී 23.9% දක්වා වැඩි විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2022 මාර්තු මාසයේ 172.7ක් වූ දර්ශකාංකය 2022 අප්‍රේල් මාසයේ 190.3ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2022 අප්‍රේල් මාසයේ දර්ශකාංකය 17.6ක වැඩිවීමක් එනම් 10.2ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 6.03%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 4.19%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට සහල්, කිරිපිටි, මයිසූර් පරිප්පු, සීනි, පාන්, පොල්තෙල්, කුකුළ් මස්, තිරිඟු පිටි, කරවල, මිරිස් කුඩු, අළුත් මාළු, ලොකු ළූණු, වියළි මිරිස්, අර්තාපල්, තුනපහ කුඩු, පළතුරු, දෙහි, බනිස් සහ මුං ඇට යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. කෙසේ වෙතත් එළවළු සහ බිත්තර යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2022 අප්‍රේල් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' *(අරක්කු, බියර් සහ බුලත් විට)*, 'රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' *(නිවාස කුලිය, ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය සහ LP ගෑස්)*, 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'සෞඛ්‍ය' *(පෞද්ගලික වෛද්‍ය ගාස්තු සහ පෞද්ගලික රෝහල් කාමර ගාස්තු)*, 'ප්‍රවාහන' *(පෙට්‍රල්, ඩීසල් සහ බස් ගාස්තු)*, 'විනෝදාත්මක හා සංස්කෘතික', 'අධ්‍යාපන' (උපකාරක පංති ගාස්තු), 'ආපනශාලා සහ හෝටල්' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'සන්නිවේදන' කාණ්ඩයේ දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2022 මාර්තු මාසයේ 17.3% සිට 2022 අප්‍රේල් මාසයේ 27.9% දක්වා වැඩිවීමක් වාර්තා විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම: 2013=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2021** | අප්‍රේල් | 142.2 | 150.8 | 135.5 | 142.5 | 0.1 | 0.5 | 5.5 | 9.7 | 2.2 | 4.1 |
| | මැයි | 143.6 | 153.3 | 135.9 | 143.7 | 1.0 | 0.8 | 6.1 | 10.3 | 2.5 | 4.2 |
| | ජූනි | 145.7 | 157.3 | 136.5 | 144.6 | 1.5 | 0.6 | 6.1 | 9.8 | 2.9 | 4.1 |
| | ජූලි | 146.6 | 158.5 | 137.2 | 145.6 | 0.6 | 0.7 | 6.8 | 11.0 | 3.2 | 4.4 |
| | අගෝ. | 147.1 | 159.4 | 137.4 | 146.5 | 0.3 | 0.6 | 6.7 | 11.1 | 3.0 | 4.7 |
| | සැප්. | 147.5 | 159.6 | 137.9 | 147.2 | 0.3 | 0.5 | 6.2 | 10.0 | 3.0 | 4.8 |
| | ඔක්. | 150.6 | 162.6 | 141.2 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 11.7 | 5.4 | 7.2 |
| | නොවැ. | 155.3 | 171.5 | 142.6 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 16.9 | 6.2 | 8.8 |
| | දෙසැ. | 161.0 | 182.1 | 144.5 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 21.5 | 7.6 | 10.8 |
| **2022** | ජන. | 166.0 | 188.3 | 148.4 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 24.4 | 10.2 | 12.9 |
| | පෙබ. | 167.8 | 190.6 | 149.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 24.7 | 11.0 | 14.1 |
| | මාර්තු | 172.7 | 195.2 | 154.9 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 29.5 | 14.5 | 17.3 |
| | අප්‍රේල් | 190.3 | 218.8 | 167.9 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 45.1 | 23.9 | 27.9 |